# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 1887/6 – 2014 නොවැම්බර් 03 වැනි සඳුදා – 2014.11.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/10/45/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. එන්. එදිරිසිංහ මයා, අංක 46/13, සමනල මාවත, අතුරුගිරිය.
02. එච්. ජී. ටියුරින් තිලකරත්න මයා, අංක 75/4, මයිලංගම පාර, අතුරුගිරිය. (ඇතුළු සේවකයින් 10 දෙනෙකු)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ්, කඩුවෙල පාර, ඔරුවල, අතුරුගිරිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77 හි, ටී. පියසෝම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 ඔක්තෝබර් මස 13 වැනි දින,
කොළඹ දී ය.


1A – G 20529 – 52 (2014/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: අයිආර්/10/45/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. එන්. එදිරිසිංහ මයා, අංක 46/13, සමනල මාවත, අතුරුගිරිය.
02. එච්. ජී. ටියුරින් තිලකරත්න මයා, අංක 75/4, මයිලංගම පාර, අතුරුගිරිය. (ඇතුළු සේවකයින් 10 දෙනෙකු)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ්, කඩුවෙල පාර, ඔරුවල, අතුරුගිරිය.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

සීමාසහිත ලංකා වානේ සංස්ථාව හා සිලෝන් හෙවි ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් කම්පැනි ලිමිටඩ් (වර්තමාන නාමය - සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ්) අතර 1996 ඔක්තෝබර් මස 31 වැනි දින ඇතිකර ගන්නා ලද ගිවිසුමේ කොන්දේසිවලට අනුව 1975 වර්ෂයට පෙර සංස්ථා සේවයට බැඳී පසුව ඉහත කී සමාගමේ සේවය සඳහා අන්තර්ග්‍රහණය කරනු ලැබූ පහත නම් සඳහන් සේවකයින් දහදෙනා (10) වසර දෙකක කාලසීමාවක් සඳහා සමාගම යටතේ අඩු වරප්‍රසාද යටතේ කොන්ත්‍රාත් පදනම මත සේවයෙහි යෙදවීම හේතුවෙන් එම නම් සඳහන් සේවකයින්හට යම් අසාධාරණයක් සිදුවූයේද යන්න හා එසේ අසාධාරණයක් සිදුවූයේ නම්, ඔවුන් එකිනෙකාහට සමාගම වෙතින් කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳව වේ.

01. එන්. එදිරිසිංහ මයා.
02. එච්. ජී. ටියුරින් තිලකරත්න මයා.
03. ජී. විමලදාස මයා.
04. කේ. සරත් පෙරේරා මයා.
05. එච්. ආනන්ද මයා.
06. පී. උපාලි නන්දසිරි මයා.
07. ඒ. ජයසේන මයා.
08. පී. හෙට්ටිආරච්චි මයා.
09. කේ. එස්. මායාදුන්න මයා.
10. ඒ. ඩී. ධර්මපාල මයා.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
*වැ.බ. කම්කරු කොමසාරිස්.*

2014 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

11 – 490

---

මගේ අංකය: අයිආර්/21/72/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 115-ඩී, කලපළුවාව පාර, කොස්වත්ත, තලංගම. (ටී. ඒ. එම්. ප්‍රියන්ත මයා වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, අංක 411, ගාලු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නුගේගොඩ, උඩහමුල්ල, ජය පාර, විනිසුරු නිවාස සංකීර්ණය, අංක 74/21 හි, කාන්ති ශ්‍රී දේවි රණසිංහ මහත්මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ගාමිණී ලොකුගේ,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 ඔක්තෝබර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/21/72/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 115-ඩී, කලපළුවාව පාර, කොස්වත්ත, තලංගම. (ටී. ඒ. එම්. ප්‍රියන්ත මයා වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, අංක 411, ගාලු පාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

ලංකා විදුලි පුද්ගලික සමාගමේ සේවය කරනු ලබන ටී. ඒ. එම්. ප්‍රියන්ත මහතා 1988.01.01 දින සිට I වැනි ශ්‍රේණියේ E-5 වැටුප් තලය ලබා ගැනීම වෙනුවෙන් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගතද? එසේ යුක්ති සහගත වන්නේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
*වැ.බ.* කම්කරු කොමසාරිස්.

2014 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

11 – 491